www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යූඒඩබ්ලිව්-ෆෝඩ් සහන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු

## රැකියා සහ ජීවන තත්ත්වයන් රැක ගැනීමට සාමාජික කමිටු තෝරා පත් කර ගනු

## Reject UAW-Ford concession demands

සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය

2009 ඔක්තෝබර් 16

ෆෝඩ් කම්කරුවන්, එක්සත් මෝටර් රථ කම්කරුවන්ගේ සමිතිය (යූඒඩබ්ලිව්) සහ ෆෝඩ් සමාගම අතර එකඟතා ගිවිසුම ප්‍රතික්ෂේප කරමින් රැකියා සහ ජීවන කොන්දේසි සුරක්ෂිත කර ගැනීමේ අරගලයක් දියත් කිරීම සඳහා සාමාජික කමිටු සංවිධානය කිරීමට ආරම්භකත්වය ගත යුතු ය. ඔබාමා පාලන තන්ත්‍රය විසින් ක්‍රියාවට දමා ඇති වැටුප් සහ සහන කපා දැමීම ආපස්සට හැරවීම පිනිස ජීඑම්, ක්‍රයිස්ලර් සහ සියලු ම රථවාහන කර්මාන්ත අලලාගත් වැඩ වර්ජනයකට මෙම අරගලය ඒකාබද්ධ කල යුතුය.

තමන් සේවය කරන්නේ මහා සංගත, ආන්ඩුව සහ යූඒඩබ්ලිව් සමිතියට සම්බන්ධ ආයතනවල ඉහල වැටුප් ලබන සිය ගනනක් විධායක නිලධාරීන්ට විනා මෝටර් රථ වාහන කම්කරුවන්හට නො වන බව යූඒඩබ්ලිව් සමිතිය විසින් යලි වතාවක් ප්‍රදර්ශනය කර ඇත. මෝටර් රථ වාහන කම්කරුවන් මොනයම් ම හෝ බරපතල අරගලයකට එලැඹීමට මත්තෙන් යූඒඩබ්ලිව් සමිතිය කර්මාන්ත ශාලාවලින් එලියට ඇද දැමිය යුතු අතර අරගලයේ නව සංවිධාන ගොඩ නැගිය යුතු ය.

මෑත ම සහන ගිවිසුමෙන් වැටුප් ඉහල නොදැමීමටත් ඊනියා ආධුනික කම්කරුවන් පරිහරනය කිරීම පුලුල් කිරීමටත් යූඒඩබ්ලිව් සමිතිය එකඟ වී ඇත. මෙමගින් ඉහල වැටුප්තලවලින් යුත් නිපුන කම්කරුවන් ඉවතට ඇද දැමීමට සැලසුම් කඩිනම් කිරීමට ද ලාභ ශ්‍රම බලකාය ගොරතර ලෙස සූරා කෑමට ද ෆෝඩ් සමාගමට ශක්‍යතාව සම්පාදනය කරනු ඇත. කම්කරු නීතින් තව දුරටත් විනාශ කිරීමට සහ වැඩ වර්ගීකරනය කිරීමට යූඒඩබ්ලිව් සමිතිය එකඟවී ඇති හෙයින් ඉතිරිව සිටිනා පැරැනි ම කම්කරුවන් වැඩ වේගවත් කිරීමට සහ වැඩ ප්‍රමානය ඉහල දැමීමට යටත් කරනු ඇත.

වත්මන් ගිවිසුම 2011 දී අහෝසි වී යන විට වැටුප් සහ ප්‍රතිලාබ පිලිබඳ අනුගම්‍ය තීරක සම්මතියකට (අනිවාර්ය බේරුම්කාර බැඳුම්කරයකට) එකඟවීම මගින්, මෙම කාරනාවන් පිලිබඳව ඡන්දය දීමේ අයිතිය යූඒඩබ්ලිව් සමිතිය විසින් ඉඳුරා ම කම්කරුවන්ගෙන් පැහැර ගෙන ඇති අතර 2015 වන තෙක් හානිපූරනය යන කාරනය මුල් කරගෙන වැඩ වර්ජනය කිරීම් තහනම් කර ඇත. මෙයට පැවතිය හැකි එක ම අර්ථය වන්නේ, ඊලඟ වසර හය පුරාවට දිගින් දිගට ම දැවන්ත කම්කරු ප්‍රතිලාබ කප්පාදු කිරීමේ සැලසුම් ක්‍රියාවට දැමීමට යූඒඩබ්ලිව් සමිතිය සූදානම් වෙමින් සිටින බව යි.

“රැකියා ආරක්ෂන” දීමනාවන්යැයි කියනු ලබන දීමනාවත් සමග - තමන්ගේම ගෙල සිඳ ගැනීම පිනිස - කම්කරුවන් ඩොලර් 1000 ක සහතික පාරිතෝෂිත දීමනාවක් හිලව් වශයෙන් ලබනු ඇත. මිලියන තුන් කාර්තුවක මෝටර් රථ රැකියා ප්‍රමානයක් අතුගා දැමූ සහ ෆෝඩ් සමාගමේ පැය ගනනට වැඩකරන්නන්ගේ රැකියා නියුක්තිය 174,000 සිට 41,000 දක්වා පහත වැටුනු පසුගිය දශක තුනේ පැවති තත්ත්වයට වැඩි යමක් මෙම පොරොන්දුවලින් අදහස් නො කෙරේ.

මෙම වතාවේ දී සමාගමට සහ යූඒඩබ්ලිව් සමිතියට සහන උදුරා ගැනීමට හේතු වශයෙන් සමාගම බංකොලොත්භාවයට ඇද වැටීමේ තර්ජනය ප්‍රයෝජනයට ගැනීමට නො හැකි ය. එක්සත් ජනපදය තුල කොටස් වෙලඳ පොලේ පූර්න හිමිකාරිත්වය අත් කර ගැනීමෙන් පසුව ෆෝඩ් සමාගම, මෙම වසරේ දෙවන කාර්තුවේ දී ඩොලර් බිලියන 2.8 ක් ඉපයූ අතර තුන්වන කාර්තුවේ දී ඉහල වර්ධනයක් පෙන්නුම් කරනු ඇතයි බලාපොරොත්තු වේ. එය, යුරෝපයේ දී දශකයකට ආසන්න කාලයක් හොඳම වෙලඳපොල කොටස භුක්ති විඳින අතර චීනය තුල දී වාහන වෙලඳාම කලින් වසරේ එම කාලයට සාපේක්ෂව තෙවන කාර්තුවේ දී සියයට 79කින් ඉහල ගියේය.

මෙවැනි කොන්දේසීන් යටතේත් වාහන කම්කරුවන් තව දුරටත් සහන අත්හැරිය යුත්තේ මන්දැයි විමසූ විට, යූඒඩබ්ලිව් සමිතියේ ප්‍රධානී, රොන්

ගෙට්ල්ෆින්ගර්, ෆොක්ස් බිස්නස් නිව්ස් වෙත ප්‍රකාශ කලේ: "ෆෝඩ් සමාගම ලාභ උපයනු දැකීමට අපට අවශ්‍ය වන අතර ඔවුන්ට කදිම කාර්තුවක් එළැඹේවායි අපි ප්‍රර්ථනා කරන්නෙමු... ඒ අතරම ෆෝඩ්, ජීඑම් සහ ක්‍රයිස්ලර් සමාගම් අතර සේවා කොන්දේසි සම මට්ටමට ගෙන ඒමට අපට අවශ්‍යය ය. අපට කේවල් කිරීමේ විධියක් ඇති අතර මේ අවස්ථාවෙන් වාසිය ගැනීමට අපට වුවමනා ය."

"ආදර්ශක කේවල්කිරීම" යන්න යොදනු ලැබුවේ සියලු ම මෝටර් රථ කම්කරුවන් හොඳ ම ගිවිසුමේ මට්ටමට ඔසවා තැබීමේ කාරනයට අදාලව ය. ජීඑම් සහ ක්‍රයිස්ලර් කම්කරුවන්ගේ ගෙල සිර කල කොන්දේසීන් ම පිලිගත යුතු යැයි යූඒඩබ්ලිව් ෆෝඩ් සමාගමේ කම්කරුවන්හට බල කිරීම මගින් දැන් එයින් අදහස් කරන්නේ එහි සම්පූර්න විරුද්ධ පැත්ත යි.

දශක ගනනාවක් තිස්සේ යූඒඩබ්ලිව් සමිතිය, සියලු ම කම්කරුවන් එක ම වගකීම - එනම් එක්සත් ජනපද මෝටර් රථ කම්කරුවන් විසින් තරගකාරීත්වය සහ ලාභදායිත්වය සහතික කර දීමේ වගකීම - දරන්නේ යැයි තර්ක කරමින් "ශ්‍රම - කලමනාකරන හවුල්කාරිත්වය" පිලිබඳ කෝපරේට්වාදී මතය දේශනා කලේ ය. මෙය රැකියාවන්හි සුරක්ෂිතතාව සහතික කර දෙනු ඇතැයි යූඒඩබ්ලිව් සමිතිය විසින් කියා පෑවේ ය. එහෙත් ඒ වෙනුවට සැබවින් ම සිදු කරනු ලැබුවේ, මෝටර් රථ කම්කරුවන්ගෙන් වංචාකරන ලද බිලියන ගනනාවක මුදල්, මෝටර් රථ කර්මාන්තය ක්‍රමයෙන් බංකොලොත්භාවයට ඇද දැමූ මහා සංගතවල විධායක නිලධාරින්ටත් දැවන්ත කොටස් හිමියන්ට සහ වෝල් වීදියටත් පවරා දීම යි.

ඔබාමා පාලන තන්ත්‍රය විසින් ජීඑම් සහ ක්‍රයිස්ලර් සමාගම් බංකොලොත්භාවයට තල්ලු කර යැවීමෙන් හා ප්‍රතිව්‍යුහගත කිරීමට බලකිරීමෙන් හාම්පුතුන් විසින් සමස්ත ආර්ථිකයේ ම වැටුප් කපා දැමීමේ මෙහෙයුමට වේදිකාව පිලියෙල කර දුන්නේ ය. නිව් යෝර්ක් ටයිම්ස් පුවත්පත මෑතක දී වාර්තා කල පරිදි, එක්සත් ජනපදයේ වැටුප් කප්පාදුව "මහා අවපාතයෙන් පසුව අන් කිසි දිනෙකටත් වඩා අනවරතව සිදු කෙරෙමින් පවතී." සමස්ත ශ්‍රම බලකායෙන් සියයට අසූවක් වන නිෂ්පාදන අංශයේ කම්කරුවන් සඳහා කෙරෙන සතිපතා ගෙවීම් බිඳ වැටීම - අර්ධ ශත වර්ෂයකට ආසන්න කාලයක දී පැවතී ගෙන යන දීර්ඝත ම බිඳ වැටීම සලකුනු කරමින් - අඛන්ඩව නව වන මාසයටත් සිදු විය. මීට පෙර වාර්තා වූ දීර්ඝත ම කාලය 1981-82 අවපාතයේ දී පැවතී ගිය මාස දෙකක කාල පරිච්ඡේදය යි.

කම්කරුවන්හට තමන්ගේ රැකියා, ජීවන ඉතුරුම් සහ ඔවුන්ගේ නිවාස නැති භංග වී යන අතරේ, මහජන අරමුදල්වලින් ට්‍රිලියන ගනනාවක් ඩැහැගත් මූල්‍යමය අධිකාරීහු "ආර්ථික පුනර්ජීවනය" භුක්ති විඳිමින් සිටිති. මෙම සතියේ දී, ප්‍රධානතම ඇමරිකානු බැංකු සහ මූල්‍යමය සංගත ගනනාවක් ඉහල ලාභයන් නිවේදනය කල අතර, වෝල් වීදිය මෙම වසරේ වන්දිවශයෙන් වාර්තාගත ඩොලර් බිලියන 140 ක් බෙදාහැරීමට සූදානම්ව සිටී. වසරක් ඇතුලත දී ප්‍රථම වතාවට කොටස් වෙලඳ පොල ඒකක 10,000කට වැඩි අගයක් ඉක්මවීමේ ප්‍රවෘතිය මහා ආයෝජකයන් විසින් උත්සව ශ්‍රීයෙන් සමරන ලදි.

විශ්‍රාමික රථ වාහන කම්කරුවන්ගේ ප්‍රතිලාබ කප්පාදු කිරීමෙන් අනතුරුව, මහා ව්‍යාපාරිකයන් වෙනුවෙන් සුවසේවා ආරක්ෂන වියදම් තවදුරටත් කපාහැරීමට ඔබාමා සැලසුම් කරයි. මෝටර් රථ කම්කරුවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා ඉහල ගෙවීම් සහ වාරික බවට පරිවර්තනය කරනු ලබන ඊනියා කැඩිලක් සෞඛ්‍ය සැලසුම් මත බදු පැනවීම සංවිධිත සෞඛ්‍ය ආරක්ෂන ප්‍රතිසංස්කරනයට ඇතුලත් කරගෙන ඇත.

මෙම සියලුම ප්‍රහාරයන්හි ලා යූඒඩබ්ලිව් සමිතිය යහමින් හවුල් වී තිබේ. හිලව් වශයෙන් ජීම්, ක්‍රයිස්ලර් සහ ෆෝඩ් සමාගම්වල දැවන්ත ම කොටස් හිමියන්ගෙන් එක් අයෙකු බවට යූඒඩබ්ලිව් සමිතිය පත්වී ඇත. මෙම සංවිධානය "වෘත්තීය සමිතියකට" වඩා යූඒඩබ්ලිව් සහ සමාගම වශයෙන් හැඳින්වීම වඩාත් නිවැරැදි වෙනු ඇත. ප්‍රමුඛ කොටස් කරුවන් වශයෙන් යූඒඩබ්ලිව් විධායක නිලධාරීන්ට තමන් නියෝජනය කරන්නේ යැයි කියනු ලබන කම්කරුවන්ගේ වරප්‍රසාදයන් සහ වැටුප් කපා දැමීමට සෘජු මූල්‍ය උත්ප්‍රේරකයක් පවතී.

ගිවිසුම පරාජය කිරීමේ උද්ඝෝෂනයක් සහ ජීඑම් සහ ක්‍රයිස්ලර් කම්කරුවන් සමග ඒකාබද්ධව ජාතික වැඩ වර්ජන ක්‍රියාමාර්ගයක් දියත් කිරීමට සූදානම් වීම සඳහා ෆෝඩ් කම්කරුවන් සාමාජික කමිටු සංවිධානය කල යුතුය. යූඒඩබ්ලිව් සමිතියේ "ඇමරිකන් දේ මිලදී ගනු" ජාතිකවාදය ප්‍රතික්ෂේප කල යුතු අතර රැකියා විනාශයට සහ ගෝලීය මෝටර් රථ කර්මාන්තයේ වැටුප් සහ රැකියා කප්පාදු කිරීමට එරෙහිව පොදු අරගලයක් ඉස්මත්තට ගැනීමට කැනඩාවේ, ලතින් ඇමරිකාවේ, ආසියාවේ සහ යුරෝපයේ මොටර් රථ කම්කරුවන් වෙත විශේෂ ආයාචනයක් කල යුතුය.

සියල්ලමටත් වඩා කම්කරු පන්තිය ඔබාමා පාලන තන්ත්‍රය සහ ඇමරිකානු ධනවාදී පක්ෂ ද්වයට - ඩිමොක්‍රටික් පක්ෂය හා රිපබ්ලිකන් පක්ෂය - එරෙහි දේශපාලන අරගලයකට මුහුන ලා සිටී. කම්කරු පන්තිය විසින් නිපැයූ ධනය යුද්ධය දිගේලි කිරීමට සහ ධනපතියන් ගලවාගැනීමට යෙදවීමට නොව සමාජ අවශ්‍යතාවන් පිරිමසාලීමට යෙදවීම සහතික කිරීම

පිනිස, කම්කරු පන්තිය තමන්ගේ අතට දේශපාලන බලය අත්කර ගත යුතු ය.

මහා අවපාතයෙන් පසුව ඇමරිකානු හා ලෝක ධනේශ්වර ක්‍රමය එලඹ ඇති දරුනුතම අර්බුදයට තබා මෝටර් රථ කර්මාන්තයේ බිඳ වැටීමට වත් කම්කරුවන් වග කිවයුතු නොවේ. මූල්‍ය කතිපයාධිපතීන් සහ සංගත ප්‍රභූව අයුතු ලෙස ඉපයූ ලාභ වන්දිගෙවීමකින් තොරව මහජන සන්තක කල යුතු ය. මනා වැටුපක් ගෙවන සුරක්ෂිත රැකියාවන් නිර්මානය කිරීමටත් සියලු දෙනාට ම අධ්‍යාපනය, නිවාස සහ සෞඛ්‍ය ආරක්ෂනය සහතික කර දීම පිනිසත් ට්‍රිලියන ගනනක් මුදල් වෙන් කල යුතු අතර නිවාස සින්න කර ගැනීම්, දොට්ට දැමීම් සහ සේවාවල් කපා හැරීම් නිමාවකට ගෙන ආ යුතු ය.

කම්කරුවන් පරම්පරා ගනනාවක ශ්‍රමය මතින් ගොඩ නැංවුන රථ වාහන කර්මාන්තය, එය විනාශ කිරීමට අදිටන් කර ගෙන සිටින සංගත විධායක නිලධාරින් සහ වෝල් වීදියේ දේපල කොල්ලකරුවන් අත තිබීමට ඉඩ දීමට හැකියාවක් නැත. ඒ වෙනුවට කර්මාන්තය වැඩ කරන ජනතාව විසින් ස්වාමිත්වය දරන සහ ඔවුන් විසින් පාලනය කරනු ලබන මහජන දේපලක් බවට පරිවර්තනය කල යුතු අතර කලමනාකාරිත්වය තෝරා පත් කිරීම ඇතුලු සියලු ම ආර්ථික තීන්දු ප්‍රජාතාන්ත්‍රික ඡන්දයකට යටත්කල යුතුය.

කම්කරු පන්තියේ අවශ්‍යතාවන්ගෙන් ආර්ථික අර්බුදයට විසඳුමක් සඳහා අත්‍යවශ්‍ය පදනම වන්නේ ප්‍රධාන සංගත සහ බැංකු ප්‍රජාතාන්ත්‍රිකව හා විචක්ෂනව පාලනය කිරීම පිනිස, සමාජවාදය උදෙසා කරන අරගලය යි. සමාජ-ආර්ථික සංවර්ධනයේ දිශාවනතිය තීන්දු කරනු ලබන මූලික ප්‍රශ්නවලට - ලාභය ද නො එසේනම් අවශ්‍යතාව ද?, මූල්‍ය කතිපයාධිකාරියේ ධනය ද නො එසේනම් කම්කරු පන්තියේ අවශ්‍යතාවන් ද? ධනවාදය ද නැතිනම් සමාජවාදය ද? - කම්කරුවන් ඍජුව මුහුන දිය යුතුය.

සමාජවාදී සමානතා පක්ෂය ගොඩ නැඟීමට ඒකාබද්ධ වන මෙන් මෙම ඉදිරි දර්ශනය හා එකඟ වන්නා වූ සියලු ම රථ වාහන කම්කරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org